# බයිබල් දැනුම මිනුම තරඟය - 2026 සිට

# ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ ගිවිසුම



## කාණ්ඩය : 10 හා 11 ශ්‍රේණි

සැකසුම : ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා (10 ශ්‍රේණිය)

## ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ ගිවිසුම

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පාඨ | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| පාස්කු මෙහෙය සඳහා පැරණි ගිවිසුමෙහි කියවීම් (දේව වචනය) | උත්පත්ති 1:1-2<br>උත්පත්ති 2:2 | දෙවියන් වහන්සේගේ පළමු ගිවිසුම මැවීම තුළ වූ බව තේරුම් ගනියි. | "ආරම්භයේ දී උන්වහන්සේ අහසත් පොළවත් මැවූ සේක. " - උත් 1:1 | ආරම්භයේ දීම දෙවියන් වහන්සේගේ බලය අණකිරීම් හා ගිවිසුම් සැලැස්ම පටන් ගත් බව පෙන්වයි. |
| | උත්පත්ති 22:1-18 | විශ්වාසයේ ගිවිසුම තුළ ආබ්‍රහම්තුමාගේ කීකරුකම දකියි. | "දෙවියන් වහන්සේ මනුෂ්‍ය ප්‍රජාව සඳහා බැටළු පැටවා දෙන සේක." - උත් 22:8 | දෙවියන් වහන්සේගේ පොරොන්දු කෙරෙහි ඇදගිල්ල හා විශ්වාසය. |
| | නික්මයාම 14:15 , 15:1 | නික්මයාම තුළ දෙවියන් වහන්සේගේ ආරක්ෂාවේ ක්‍රියාව තේරුම් ගනියි. | "උන්වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක ඔබ නිශ්චලව සිටිය යුතුය." නික් 14:14 | දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම හා ගිවිසුම් ආරක්ෂාව පෙන්නුම් කරයි. |
| | යෙසායා 54:5-14 | ගිවිසුම තුළ දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල්හි ස්වාමියාණන් බව | "නුඹේ මැවුම්කාරයානෝ නුඹේ ස්වාමිපුරුෂයා මෙන් වන සේක." යෙසායා 54:5 | දෙවියන් වහන්සේ තම ජනතාව සමඟ තිබෙන ප්‍රේමණීය හා කල්පවතින සම්බන්ධතාවය. |
| | යෙසායා 55:1-11 | ගැලවීම හා ගිවිසුම තුළ ජීවිතයට ආරාධනා කරයි. | "හමුවිය හැකි බැවින් සමිඳුන් සොයා යන්න ළඟම සිටියදී එතුමාණන් අයදින්න. " - යෙසායා 55:6 | දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ගැලවීමේ කරුණාව තුළ ජීවත්වීමට සැමට ආරාධනා කරයි. |
| | බාරුක් 3:9-15, 32 හා 4:4 | දෙවියන් වහන්සේගේ ගිවිසුම තුළ ප්‍රඥාව හා මඟපෙන්වීම | ඉශ්‍රායෙල් ජනයෙනි අපි ආසිරි ලද්දෙමු. දෙවිදාණන් කැමති දේ අපට පවසා ඇත. - බාරුක් 4:4 | ප්‍රඥාව තුළින් දෙවියන් වහන්සේගේ ගිවිසුම් වලට මඟ පෙන්වයි. |
| | එසකියෙල් 36:16-17, 18-28 | නව ජීවිතයක් හා ගිවිසුම් අලුත් කිරීම පිළිබඳ පොරොන්දුව | "නුඹලා පිරිසිදු වන ලෙස මම නුඹලා කෙරෙහි පිරිසිදු දිය ඉසින්නෙමි එවිට නුඹලා පවිත්‍රවනු ඇත. " - එසකියෙල් 36:25 | දෙවියන් වහන්සේ තම ගිවිසුම් අළුත් කරන්නේ අධ්‍යාත්මික ජීවිතයක පරිවර්තනයක් පොරොන්දු වෙමින්ය. |
| පාස්කු මෙහෙය සඳහා නව ගිවිසුමෙහි කියවීම් (දේව වචනය) | රෝම 6:3-11<br>ලූක් 21:1-12 | බෞතිස්මය ලැබූ අය ක්‍රිස්තුස් වහන්සේගේ මරණය හා උත්ථානය තුළ එක් කරයි. | "මින්මතු අප පාපයට වහල් නොවන පිණිස අපේ පාපී ස්වභාවය නැතිවන සේ අපේ පූර්ව මිනිස් ගතිය උන්වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසනු ලැබූ බව අපි දනිමු." රෝම 6:3<br>"'උන්වහන්සේ මෙහි නැත උන්වහන්සේ උත්ථාන වූ සේක" ලූක් 24ථ6 | දෙවියන් වහන්සේ තම ගිවිසුම් අළුත් කරන්නේ අධ්‍යාත්මික ජීවිතයක පරිවර්තනයක් පොරොන්දු වෙමින්ය. |

| | | | | |
|---|---|---|---|---|
| බෞතීස්ම ස්නාපනය | මතෙව් 3:11-17<br>ජොහාන් 8:12<br>එළිදරව්ව 1:8<br>ක්‍රියා 2:38,<br>කොලොස්සි 3:1-7,<br>එපීස 4:22-24 | බෞතිස්මය ක්‍රිස්තුස් වහන්සේගේ ගිවිසුමට ඇතුල්වීම බව තේරුම් ගනියි. වතුර ඉටිපන්දම වැනි සංකේත හඳුනා ගනියි.<br>බෞතීස්ම පොරොන්දු අලුත් කිරීමට ඉගෙන ගනියි. | ''ඔබ සියලු දෙනාම පසුතැවී සිත් හරවා ගෙන පව්කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය ලබන්න.'' (ක්‍රියා 2:38)<br><br>''ලෝකයේ ආලෝකය මම ය.''<br>ජොහාන් 8:12 | බෞතීස්මය ක්‍රිස්තුස් වහන්සේ තුල නව ජීවිතයක් ලබා දෙයි. |
| ශුද්ධ වූ දිව්‍ය සත්ප්‍රසාදය | 1 කොරි 10:16-21 | දිව්‍ය සත්ප්‍රසාදය ගැලවීමේ, ගිවිසුමෙහි භෝජනය ලෙස හා ක්‍රිස්තුස් වහන්සේ හා සභාව සමඟ එකමුතු-කම හඳුනා ගනියි. | ''අප ආසිරි කුසලාන ගෙන ආශීර්වාද කරන විට ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරයේ සහභාගීකම නොවේද? අප රොටී කඩන විට ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගීකම නොවේද?'<br>(1 කෙරින්ති 10:16) | දිව්‍ය සත්ප්‍රසාදය ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක්සත් කරන අතර ගිවිසුම් පොරො-න්දු ඉටු කරයි. |
| ඇදහිල්ල - නිසියානු ( සෑම වගන්තියක් කෙරෙහිම විශේෂයෙන් 8 වන වටගන්තියට විශේෂ අවධානයක් දෙයි) | අපෝස්තුලුවැන්ගේ විශ්වාස ලක්ෂණය හා නිසියානු විශ්වාස ලක්ෂණය | සම්පූර්ණයෙන් කියවා තේරුම් කරයි.<br>ශු. සභාව තුළ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය තේරුම් ගනි. | ''එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ වෙත පැමිණි කළ ඔබ බලය ලබන්නහුය. '' ක්‍රියා 1:8 | ක්‍රිස්තුස් වහන්සේගේ ගිවිසුම අඛන්ඩව පවත්වාගෙන යාමේ දී සහ ශු. සභාව මෙහෙයවීමේ දී ශුද්ධාත්මයාණන්ගේ කාර්යභාරය පෙන්වයි. |
| යාච්ඤාව - ගීතාවලිය | ගීතාවලිය 15,18,103 | ගීතාවලිය ගිවිසුම ප්‍රශංසාව හා ස්තුතිදීමට භාවිතා කරයි. | ''සමිඳුනී ඔබ දෙව් මැඳුරේ කවරෙකුට සිටිය හැකිද? ඔබ කන්දේ කවරෙකුට සිටිය හැකිද? (ගීතාවලිය 15:1)<br><br>''සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් සම්පූර්ණය. නොකිපෙන සුලුය. අතිශයින් කරුණාවන්තය.<br>ගීතාවලිය 103:8 | දෙවියන් වහන්සේගේ ගිවිසුම් ප්‍රේමයට ප්‍රතිචාර වශයෙන් ගීතාවලියෙහි කෘතඥතාවය විශ්වාසය හා ප්‍රශංසාව උගන්වයි. |



# බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

## 11 ශ්‍රේණිය තේමාව ගිවිසුම සම්පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුස් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| 1. ඒදන් ගිවිසුම | උත්පත්ති 3:15<br>රෝම 5:12-21 | ගැලවුම්කරු පිළිබඳ දෙවියන් වහන්සේගේ පළමු පොරොන්දුව සහ එය ක්‍රිස්තුස් වහන්සේ තුළ ඉටුවූ ආකාරය තේරුම් ගනියි. | ''තා සහ ස්ත්‍රිය අතර ද තගේ වංශය හා ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තමන්නෙමි ....''<br>උත්පත්ති 3:15<br><br>''එක මනුෂ්‍යයෙකුගේ පාපය නිසා එකම තැනැත්තෙකු මඟින් මරණය සියල්ලන් කෙරෙහි රජකම් කළේනම් ...'' රෝම 5:17 | මිනිසාගේ වැටීමෙන් දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පෙන්වයි : ක්‍රිස්තුස් වහන්සේ මරණය හා පාපය ජයගනී. |
| 2. ආබ්‍රහම්තුමා සමඟ කළ ගිවිසුම | උත්පත්ති 12:1-3,<br>ගලාති 3:16 | ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත්වූ සියලු ජාතීන්ට දෙවියන් වහන්සේ ආශීර්වාද කරන බවට වූ පොරොන්දුව හඳුනා ගැනීම. | ''නුඹට ආසිරිපතන අයට මමත් ආසිරි පතමි නුඹට දෙස් තබන අයට මමත් දෙස් තබමි'' - උත් 12ඃ3<br>''පොරොන්දු දෙන ලද්දේ ආබ්‍රහම්ට හා ඔහුගේ වංශට ය වංශය යන්නේන අදහස් කරන ලද්දේ ක්‍රිස්තුස් වහන්සේය'' - ගලාති 3:16 | දෙවියන් වහන්සේගේ ගිවිසුමේ සහ විශ්වීය ගැලවීමේ අඛණ්ඩතාව ඉස්මතු කරයි. |
| 3. නෝවා සමඟ ගිවිසුම | උත්පත්ති 9:8-17<br>1 පේදුරු 3:20-21 | ජලය හා දෙවියන් වහන්සේගේ දයාව තුළින් දෙවියන් වහන්සේගේ ගැලවීමේ ගිවිසුම තේරුම් ගනියි. | ''නුඹලා සමඟ පිහිටුවන ලද ගිවිසුම වනාහි මින්පසු කවදාවත් ජලගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ කරනු නොලබන බව ය '' උත්පත්ති 9:11<br>''එය වනාහි ශරීරයේ කිලුටු සේදීමක් නොව ජේසුස් ක්‍රිස්තුන් වහන්සෙගේ පුනර්ජීවනය කරණකොටගෙන නිදොස් හෘද සාක්ෂියකින් දෙවියන් වහන්සේට කරන ගිවිසුමක්ය'' 1 පේදුරු 3:21 | බෞතීස්මය පූර්වාදර්ශනය කරයි. දෙවියන් වහන්සේගේ ගිවිසුම, දයාව, ආරක්ෂාව |



| | | | | |
|---|---|---|---|---|
| 4. මෝසෙස්ගේ ගිවිසුම | නික්මයාම 19,24<br>මතෙව් 5-7 | ක්‍රිස්තුස් වහන්සේට සූදානම් වීමක් ලෙස දෙවියන් වහන්සේගේ නීතිය ඉගෙන ගනියි. කන්ද උඩ දේශනාවේදී සම්පුර්ණත්වයට පත්වීම. | ''නුඹලා මට පූජක රාජ්‍යයක්ද කැපවූ ජාතියක්ද වන්නහුය'' - නික් 19:6<br>''මම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය අවලංගු කරන පිණිස ආවෙමියි නොසිතන්න මා ආයේ ඒවා අවලංගු කිරීමට නොව සම්පූර්ණ කිරීමටය'' - මතෙව් 5:17 | දෙවියන් වහන්සේගේ ගිවිසුමේ මඟ පෙන්වීම සහ සදාචාරාත්මක නීතිය ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ බව. |
| 5. දාවිත්ගේ ගිවිසුම | 2 සාමුවෙල් 7:12-16<br>මතෙව් 1:1 | දාවිත්ගේ පෙළපතින් පැමිණි සදාකාලික රජු ලෙස ක්‍රිස්තුස් වහන්සේව හඳුනා ගැනීම. | ''නුඹේ වංශයද රාජශ්‍රීය ද මගෙ ඉදිරියෙහි සදහටම ස්ථිර කරනු ලබන්නේය. නුඹේ සිංහාසනය සදහටම පිහිටුවනු ලබන්නේය.'' 2 සාමුවෙල් 7:16<br>''ආබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වංශාවලිය'' - මතෙව් 1:1 | ජේසුස් වහන්සේ තුළ ඉටු වූ රාජකීයත්වය පිළිබඳ දෙවියන් වහන්සේගේ පොරොන්දුව පෙන්වයි. |
| 6. ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ ජේසුස් වහන්සේගේ පොරොන්දුව ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ ජේසුස් වහන්සේගේ පොරොන්දුව | ජොහාන් 14:16-17,26 | ගුරුවරයෙකු හා මඟපෙන්වන්නකු ලෙස ශුද්ධාත්මයාණන්ගේ පොරොන්දුව දැනගනියි. පෙන්වන්නකු ලෙස ශුද්ධාත්මයාණන්ගේ පොරොන්දුව දැනග නියි. | ''එවිට මම පියාණන් වහන්සේගෙ න් අයැදින්නෙමි. උන්වහන්සේ ද ඔබ සමග සදහටම සිටින පිණිස වෙන්ත සහයදායකයෙකු දෙන සේක.'' ජොහාන් 14:16<br>''එහෙත් මාගේ නාමයෙන් පියානන් වහන්සේ එවන සහායදායකයාණන් වහන්සේ එනම් ශුද්ධාත්යාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින් මා වදාල සියල්ල ඔබට සිහිපත් කරවන සේක. ජොහාන් 14:26 | ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවර දිගටම කරගෙන යයි ඇදහිලිවන්තයන්ට ගිවිසුම් ඇදහිල්ලෙන් ජීවත් වීමට උපකාර කරයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවර දිගටම කරගෙන යයි ඇදහිලිවන්තයන්ට ගිවිසුම් ඇදහිල්ලෙන් ජීවත් වීමට උපකාර කරයි. |
| මඟපෙන්වන්නා හා උපදේශකයා ලෙස ශුද්ධාත්මයාණෝ | ජොහාන් 14:15-31 | සභාවට මඟපෙනවීමේදී හා සැනසීම ලබාදීමේදී ශුද්ධාත්මයාණෝගේ කාර්යභාරය | ''උන්වහන්සේ සම්පූර්ණ සත්‍ය කරා යෑමට එබට මඟ පෙන්වන සේක.'' ජොහාන් 14:16<br>''ශාන්තිය ඔබ වෙත ප්‍රදානය කර යමි. මාගේ ශාන්තිය ඔබට දෙමි.'' ජොහාන් 14:27 | ඇදහිලිවන්තයන්ගේ ජීවිත තුළ ආත්මයාණන්ගේ ක්‍රියාකාරී පැවැත්ම පෙන්නුම් කරයි. සදාචාරාත්මක හා අධ්‍යාත්මික තේරීම් සඳහා මඟ පෙන්යි. |

| | | | | |
|---|---|---|---|---|
| ශුද්ධවූ සභාව තුළ මෙහෙවර (පාවුළුතුමන්ගේ ලිපි) | 1 කොරින්ති 12, එපීස 4, රෝම 12 | එකමුතුකම ගොඩනැගීමට සහ ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීමට ශු. සභාවේ මෙහෙවර ගෙන ගනියි. | "මනුෂ්‍ය ශරීරයෙහි බොහෝ අවයව තිබුණත් ඒ අවයව විවිධාකාර වූවත් ඒ සියල්ල එකම ශරීරයක් වන්නාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේත් එකම ශරීරයක් වන සේක." 1 කොරින්ති 12:12 "දෙවියන් වහන්සේ සියලු දීමනා ද කැඳවීම ද වෙනස් නොකරන සේක." රෝම 11:29 | සභාව ක්‍රිස්තුස් වහන්සේගේ ගිවිසුම් මෙහෙවර දිගටම කරගෙන යයි. සෑම සාමාජිකයෙකුටම කාර්‍යභාරයක් ඇත. |
| පර්වතය වන පේදුරු හා අපෝස්තලික මෙහෙවර | මතෙව් 16:18 | පේදුරුගේ භූමිකාව හා අපෝස්තලික අධිකාරිය තේරුම් ගනී. | "ඔබ පේදුරුය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනග න්නෙමි."මතෙව් 16:18 "මාගේ බැටළුවන් පෝෂණය කරන්න." ජොහාන් 21:17 | අපෝස්තලික අධිකාරිය සහ ගිවිසුම් අඛණ්ඩතාව ස්ථාපිත කිරීම. |
| අභිවෘද්ධි ආලේපය | නික්මයාම 30:22-33 2 කොරින්ති 1:21-22, එපීස 1:13 2 තිමොති 2:3 | අභිවෘද්ධි ආලේපය මඟින් ශුද්ධාත්මයාණන්ගෙ න් ශක්තිමත් කර ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ කරන බව තේරුම් ගනියි. | "උන්වහන්සේගේ මුද්‍රාව අප පිට තබා අපගේ සිත් තුළ අපට අත්තිකාරමක් වශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවා වදාළ සේක." 2 කොරින්ති 1:22 "ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ විශ්වාසී භේවායෙකු සේ දුක්විඳීමට පංගුකරයෙක් වන්න." 2 තිමොති 2:3 | අභිවෘද්ධි ආලේපය මඟින් ගිවිසුමට සම්බන්ධවීම ශක්තිමත් කර ක්‍රිස්තු මෙහෙවර සඳහා සූදානම් කරයි. |
| ඇඳහිල්ල | සියලුම විශ්වාස ලක්ෂණ ත විශේෂ අවධානයක් 08 හා 09 වගන්ති වලට දෙයි | විශ්වාසය උච්චාරණය කර පැහැදිලි කරයි. ශුද්ධාත්මයාණන්ගේ භූමිකාව හා ශුද්ධ වූ සභාව ලිළිබඳ තේරුම් ගනියි. | "මම ඔබට කියමි. ඔබ පේදුරුය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි." මතෙව් 16:18 | අපෝස්තලික අධිකාරිය සහ ගිවිසුම් අඛණ්ඩතාව ස්ථාපිත කිරීම. |



| | | | | |
|---|---|---|---|---|
| යාච්ඤාව | නික්මයාම 15, ගීතාවලිය 103, යෙසායා 12 | විශ්වාසය ස්තුතිය හා දෙවියන් වහන්සේගේ ගිවිසුම පිළිබඳ සතුට පෙන්වයි. | 'සමිදාණෝ මා සවිය හා ගීතය වෙති.'' නික්මයාම 15:2 ''සමිදාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්නය. නොකිපෙන සුලුය. අතිශයින් කරුණාවන්තය.'' ගීතාවලිය 103:8 ''සමිඳුන් කල අරුම පුදුම දේ නිසා පසස් ගී ගයන්න. මුළු ලොවටම ඒ ගැන දන්වන්න.'' යෙසායා 12:5 | විශ්වාසයේ ඒකත්වයත් ගිවිසුම් සභාව තුළ ආත්මයාණන් වහන්සේගේ භූමිකාවත් පෙන්වයි. |



# 10 ශ්‍රේණිය

# ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ ගිවිසුම

**I. පොදු අරමුණු** - **පාස්කු මෙහෙය සඳහා භාවිතා වන දේව වචනය (ගැළවීමේ ඉතිහාසය අනුපිළිවෙලින්)**

**■ පැරණි ගිවිසුම දේව වචනය**

- උත්පත්ති 1:1-2, 2 - මැවීම
- උත්පත්ති 22:1-18 - ඊසාක් පූජා කිරීම
- නික්මයාම 14:15 - 15:1 - රතු මුහුද තරණය කිරීම හා මෝසෙස්ගේ ගීතය
- යෙසායා 54:5-14 - දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවගේ ස්වාමියාණන් ලෙස
- යෙසායා 55:1-11 - ගැලවීමට ආරාධනයක්
- බාරුක් 3:9-15, 32 - 4:4 - ප්‍රඥාව හා මඟපෙන්වීම
- එසකියෙල් 36:16-17, 18-28 - නව ජීවිතයකට හා ගිවිසුම අලුත් කිරීමට පොරොන්දු

ඉගෙනුම් ඵල

- ගැලවීමේ ඉතිහාසය ක්‍රිස්තුන් වහන්සේව පිළිගැනීමට සූදානම් කිරීමක් ලෙස තේරුම් ගනියි.
- දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තභාවය හා ගිවිසුම් පොරොන්දු හඳුනාගනියි.
- පැරණි ගිවිසුම ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ බව දකියි.

අමතර පාඨ

- ''ආරම්භයේ දී දෙවියන් වහන්සේ අහසත් පොළවත් මැවූ සේක'' - (උත්පත්ති 1:1)
- එවිට ආබ්‍රහම් ''පුතා, දෙවියන් වහන්සේ ම පූජාව සඳහා බැටළු පැටවා දෙන සේකැ''යි පිළිතුරු දුනි. - (උත්පත්ති 22:8)
- ''උන්වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක. ඔබ නිශ්චල ව සිටිය යුතු ය'' යි කී ය. - (නික්මයාම 14:14)
- ''නුඹලා පිරිසිදු වන ලෙස මම නුඹලා කෙරෙහි පිරිසිදු දිය ඉසින්නෙමි. නුඹලාගේ සියලු අපවිත්‍රකම්වලින් ද නුඹලාගේ සියලු දේව රූප වලින් ද නුඹලා පිරිසිදු කරන්නෙමි.'' - (එසකියෙල් 36:25)

❖ ගැලවුම්කරුවන ක්‍රිස්තුන් වහන්සේ අවධාරණය කරන ගිවිසුම් විශ්වාසවන්තභාවය ගැන දෙවියන් වහන්සේගේ ස්ථාවර සැලැස්ම දකියි

**■ නව ගිවිසුමේ දේව වචනය**

- රෝම 6:3-11 - බෞතීස්ම ස්නාපනය හා ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතය
- ලූක් 24:1-12 - නැවත නැගිටීම හා අනාවැකි සම්පූර්ණවීම

ඉගෙනුම් ඵල

- පැරණි ගිවිසුමේ පොරොන්දු හා ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය අතර සම්බන්ධය සොයා ගනී.
- බෞතීස්මය ගැලවීමේ ගිවිසුමට ඇතුල්වීමක් ලෙස හඳුනා ගනියි.
- ගැලවීමේ ඉතිහාසයේ පූර්ණත්වය ක්‍රිස්තුස් වහන්සේ බව තේරුම් ගනියි.

**අමතර පාඨයන්**

- ''බෞතීස්ම-ස්නාපනයෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ අප සියල්ලන් ම එම බෞතීස්ම-ස්නාපනයෙන් උන්වහන්සේගේ මරණයෙහි උන්වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ බව ඔබ නොදන්නහු ද'' - (රෝම 6:3)



- ''උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ උත්ථාන වූ සේක.'' - (ලූක් 24:6)

❖ ඉහත පාඨයන් ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ නව ගිවිසුම හා පාපයත්, මරණයත් පරාජය කළ ක්‍රිස්තුස් වහන්සේගේ විජයග්‍රහණයත් ඉස්මතු කර පෙන්වයි.

## II. සක්‍රමේන්තු - 'ගිවිසුම' ඉෂ්ටවීම



### A. බෞතීස්ම ස්නාපනය

**අවධානය** - බෞතීස්ම ජලය (මතෙව් 3:11-17), පාස්කු ඉටිපන්දම (ජොහාන් 8:12, එළිදරව්ව 1:8), බෞතීස්ම පොරොන්දු අළුත් කිරීම (ක්‍රියා 2:38, කොලොස්සි 3:1-17, එපීස 4:22-24)

**ඉගෙනුම් ඵල**

- ප්‍රසාද ස්නාපනය හා වරප්‍රසාද ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගිවිසුමකට ඇතුල්වීම බව තේරුම් ගනී.
- වතුර ඉටිපන්දම වැනි සංකේත හඳුනා ගනියි.
- එදිනෙදා ජීවිතය තුළ බෞතීස්ම පොරොන්දු අලුත් කිරීමට ඉගෙන ගනියි.

අමතර පාඨ

- ''ඔබ සියලු දෙනාම පසුතැවී සිත් හරවා ගෙන පව් කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය ලබන්න.'' (ක්‍රියා 2:38)
- ''බෞතීස්ම ස්නාපනයේ දී ඔබ උන්වහන්සේ සමඟ වළලනු ලැබ උන්වහන්සේ මරණයෙන් උත්ථාන කළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරී බලය තුළ ඇති විශ්වාසය කරන කොටගෙන ක්‍රිස්තුස් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූවහු ය.'' (කොලොස්සි 2:12)
- ''ලෝකයේ ආලෝකය මම ය. මා අනුගමනය කරන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය.'' (ජොහාන් 8:12)

❖ බෞතීස්මය යනු දෙවියන් වහන්සේ සමඟ කරන ගිවිසුමෙහි සක්‍රමේන්තුමය සළකුණ වන අතර එය ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතයක් ලබා දෙයි.

### B. දිව්‍ය පූජාව

**අවධානය :** ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට හා රුධිරයට සහභාගී වීම (1 කොරි 10:16-21)

**ඉගෙනුම් ඵල**

- දිව්‍ය සත්ප්‍රසාදය ගැලවීමේ ගිවිසුම් භෝජනය ලෙස තේරුම් ගනියි.
- ශු. සභාව හා ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇති ඒකාබද්ධතාවය/එකමුතුකම හඳුනා ගනියි.
- දිව්‍ය සත්ප්‍රසාදය කල්වාරි ගිවිසුමේ අඛණ්ඩ පැවැත්ම ලෙස දකියි.

අමතර පාඨ

- '' අප ආසිරි කුසලාන ගෙන ආශීර්වාද කරන විට ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරයේ සහභාගී කම නොවේද? අප රොටී කඩන විට ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගී කම නොවේද'' **(1 කොරින්ති 10:16)**
- ''රොටිය එකක් වන බැවින් අපි බොහෝ දෙනෙක් වුව ද එකම ශරීරයක් වන්නෙමුග මන්ද අප එක රොටියක් බෙදා ගන්නා බැවිනි.'' **(1 කෙරින්ති 10:17)**

❖ **දිව්‍ය සත්ප්‍රසාදය, ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක්සත් කරන අතර ගිවිසුම් පොරොන්දු ඉටු කරයි.**

## III. ඇදහිල්ල - නිසියානු විශ්වාස ලක්ෂණය

**අවධානය** - සෑම වගන්තියක් කෙරෙහිම, විශේෂයෙන් 8 වන වගන්තියට විශේෂ අවධානයක් දෙයි. (ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශු. සභාව)

**ඉගෙනුම් ඵල**

- සම්පූර්ණයෙන් කියවා තේරුම් කරයි.
- ශු. සභාව තුළ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය තේරුම් ගනී.
- නිසියානු විශ්වාස ලක්ෂණයේ 8 වගන්තිය සක්‍රමෙන්තු හා ශුද්ධ සභාවේ දූත මෙවහෙවර හා සම්බන්ධ කරයි.

අමතර පාඨ

- ''සමිඳාණන් වහන්සේගේ ආත්මයාණන් මා කෙරෙහි ඇත. මන්ද උන්වහන්සේ මා ආලේප කළ සේක.'' (ලූක් 4:18)
- ''එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ වෙත පැමිණි කළ ඔබ බලය ලබන්නහු ය'' - (ක්‍රියා 1:8)

❖ ක්‍රිස්තුස් වහන්සේගේ ගිවිසුම අඛන්ඩව පවත්වාගෙන යාමේ දී සහ ශු. සභාව මෙහෙයවීමේ දී ශුද්ධාත්මයාණන්ගේ කාර්යභාරය පෙන්වයි.

## IV. යාච්ඤාව - ගීතාවලිය

- පාඨ - ගීතාවලිය 15,18,103 යන ගීත

### ඉගෙනුම් ඵල

- ගිවිසුම් විශ්වාසය, ප්‍රශංසාව හා ස්තුති කිරීම යන දෑ ප්‍රකාශ කිරීමට ගීතාවලිය භාවිතා කරයි.
- දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම, කරුණාව හා මඟපෙන්වීම හඳුනා ගනියි.
- බයිබලයේ ගිවිසුම් තේමාවන් ඔස්සේ පෞද්ගලික යාච්ඤා නිර්මාණය සම්බන්ධ කරයි.

### අමතර පාඨ

- "සමිඳුනි, ඔබ දෙව් මැඳුරේ කවරෙකුට සිටිය හැකි ද? ඔබ කන්දේ කවරෙකුට සිටිය හැකි ද?" (ගීතාවලිය 15:1)
- "මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි." - (ගීතාවලිය 18:1)
- "සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පූර්ණය. නොකිපෙන සුළුය. අතිශයින් කරුණාවන්තය." (ගීතාවලිය 103:8)

❖ දෙවියන් වහන්සේගේ ගිවිසුම් ප්‍රේමයට ප්‍රතිචාර වශයෙන් ගීතාවලියෙහි ඉහත පාඨ අපට කෘතඥතාවය, විශ්වාසය හා ප්‍රශංසාව ජීවත් කරවීමට උගන්වයි.

### ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනා

- **කථාන්දර ක්‍රමය** - මැවීමේ සිට උත්ථානය දක්වා ගැළවීමේ අනුපිළිවෙල
- **දෘශ්‍යාධාර** - වතුර හා ඉටිපන්දම් - බෞතිස්මය සඳහා, පූප හා පාත්‍රය - දිව්‍ය සත්ප්‍රසාදය සඳහා, ගින්දර - ශුද්ධාත්මයාණන් සඳහා, ගිවිසුම් සඳහා වන ශු. සභාවේ සංකේත
- **නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**
  - ☼ ගැලවීමේ ඉතිහාසය ගලා ආ අනුපිළිවෙල හෝ ගිවිසුම් සංකේත චිත්‍රයට නැගීම
  - ☼ ප්‍රසාද ස්නාපනය, අන්තිම රාත්‍රී භෝජනය, පෙන්තකොස්ත දිනය වැනි දෑ රඟදැක්වීම
  - ☼ ගිවිසුම් පොරොන්දු පිළිබඳව නිසදැස්, පෞද්ගලික මෙනෙහි කිරීමක් ලියා දැක්වීම
- **ක්‍රියාකාරී ගීත** - පාස්කු මංගල ගීතය,පාස්කු මෙහෙයෙහි ගැයෙන පිළිතුරු ගීත,මරියානන්ගේ උදාන ගීය

## V. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත වටය | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු | 40 |
| කටපාඩම් පද වටය | ගීතාවලිය හා අමතර පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර | ගැලවීමේ ඉතිහාසය අනුපිළිවෙල හෝ සක්‍රමේන්තු අවස්ථා | 20 |
| අවබෝධය (වාචික ප්‍රශ්න වටය) | "ඇයි" ප්‍රශ්න හෝ ගිවිසුම් තේමා | 20 |

**සම්මාන මට්ටම**

- රන් — 85–100
- රිදී — 70–84
- ලෝකඩ — 50–69
- සහතික පත්‍ර — 50අඩු

# අමතර පාඨ ඇතුලත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ

- ගිවිසුම් පරිපූර්ණත්වය වන ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ තේමාවන් ගැඹුරින් අධ්‍යනය කරයි
- උච්චාරණය හා මෙනෙහි කිරීම සඳහා කටපාඩම් පද සපයයි
- සක්‍රමේන්තු, විශ්වාස ලක්ෂණය හා යාච්ඤා, බයිබලීය දැනුම හා සම්බන්ධ කරමින් අරුත සොයා ගනී.



## 11 ශ්‍රේණිය

**තේමාව**

# ගිවිසුම සම්පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුස් වහන්සේ

## I. ප්‍රධාන අරමුණු - පැරණි හා නව ගිවිසුම් තුළ ක්‍රිස්තුස් වහන්සේ

### පැරණි ගිවිසුම තුළ ගිවිසුම

1. **ඒදන් උයනේ ගිවිසුම** - උත්පත්ති 3:15, රෝම 5:12-21

**ඉගෙනුම් ඵල**

- ගැලවුම්කරුවෙකු පිළිබඳ පළමු පොරොන්දුව හා එය ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත්වූ බව තේරුම් ගනියි.
- පාපය හා මරණය පරාජය කළ ජයග්‍රාහකයා ලෙස ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගනියි.

**අමතර පාඨ**

- "තා සහ ස්ත්‍රිය අතර ද, තගේ වංශය හා ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි." - (උත්පත්ති 3:15)
- "එක මිනිසෙකුගේ අකීකරුකමින් සියල්ලන්ම පවුකාරයන් වූ සේම එක මිනිසෙකුගේ කීකරුකමින් සියල්ලෝම දමිටු බවට පමුණුවනු ලබන්නෝයි." - (රෝම 5:17)

❖ දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව ආරම්භ වන්නේ මිනිසාගේ වැටීම තුළ බවත් ක්‍රිස්තුස් වහන්සේ පාපය හා මරණය පරාජය කර ජයගත් බවත් මෙම පාඨ වලින් පෙන්වා දෙයි.

2. **ආබ්‍රහම්තුමාගේ ගිවිසුම** - (උත්පත්ති 12:1-3, ගලාති 3:16)

**ඉගෙනුම් ඵල :**

- ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ සියලු ජාතීන්ට ආශීර්වාද කරන බවට දෙවියන් වහන්සේගේ පොරොන්දු හඳුනා ගැනීම.
- දෙවියන් වහන්සේගේ ගිවිසුම තුළ ආබ්‍රහම්තුමා විශ්වාසයේ පරමාදර්ශයක් ලෙස තේරුම් ගනියි.

**අමතර පාඨ :**

- "නුඹ මගෙන් ආසිරි ලත් අයුරින් මිහිමත සව්සත ආසිරි ලබනු ඇත." - (උත්පත්ති 12:3)
- "පොරොන්දු දෙන ලද්දේ ආබ්‍රහම්ට හා ඔහුගේ වංශයට ය. වංශය යන්නෙන් අදහස් කරන ලද්දේ ක්‍රිස්තුන් වහන්සේය." - (ගලාති 3:16)

❖ ඉහත පාඨ දෙවියන් වහන්සේගේ ගිවිසුම් හා විශ්වීය ගැළවීමේ අඛණ්ඩතාවය ඉස්මතු කරයි.

3. **නෝවාගේ ගිවිසුම** - (උත්පත්ති 9:8-17, 1 පේදුරු 3:20-21)

**ඉගෙනුම් ඵල :**

- දෙවියන් වහන්සේගේ දයාව හා ගිවිසුම් රැකවරණය/ආරක්ෂාව දකියි.
- නෝවා සමග ගිවිසුම හා කතෝලික බෞතිස්මය අතර සම්බන්ධය දකියි.

**අමතර පාඨ :**

- "නුඹලා සමග පිහිටුවන ලද ගිවිසුම වනාහි මින්පසු කවදාවත් ජල ගැල්මකින් මහ පොළොව වනසනු නොලබන බව." - (උත්පත්ති 9:11)
- "මෙහි වතුර යන්නෙන් අදහස් කරනු ලබන්නේ අපට ගැලවීම ලබාදෙන බෞතිස්ම ස්නාපනය යි. එය වනාහි ශරීරයේ කිලිටු සේදීමක් නොව නිදොස් හෘද සාක්ෂියකින් දෙවියන් වහන්සේ සමග කරන පොරොන්දුවක් ය." - (1 පේදුරු 3:21)



❖ බෞතිස්මයේ පූර්වරූපය හා දෙවියන් වහන්සේගේ ගිවිසුම් දයාව මෙම පාඨ මඟින් පෙන්නුම් කරයි.

4. **මෝසෙස් සමග ගිවිසුම** : (නික්මයාම 19,24 පරිච්ඡේද හා මතෙව් 5-7 පරිච්ඡේද)



දාවිත් රජතුමා

**ඉගෙනුම් ඵල**

- දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව ක්‍රිස්තුස් වහන්සේ සඳහා වූ සූදානම බව ඉගෙන ගනියි.
- කන්ද උඩ දේශනාවේදී ක්‍රිස්තුන් වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණත්වයට පත් කළ බව තේරුම් ගනියි.

**අමතර පාඨ**

- ''නුඹලා මට පූජක රාජ්‍යයක් ද කැපවූ ජාතියක් ද වන්නහුය.'' - (නික්මයාම 19:6)
- ''මම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය අවලංගු කරන පිණිස ආවෙමි යි නොසිතන්න. මම ආවේ ඒවා අවලංගු කිරීමට නොව සම්පූර්ණ කිරීමට ය'' - (මතෙව් 5:17)

❖ දෙවියන් වහන්සේගේ ගිවිසුමේ මඟ පෙන්වීම සහ සදාචාරාත්මක නීතිය ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ බව මෙම පාඨ වලින් පෙන්නුම් කරයි.

5. **දාවිත් සමඟ ගිවිසුම** - (2 සාමුවෙල් 7:12-16, මතෙව් 1:1)

**ඉගෙනුම් ඵල**

- දාවිත්ගේ පෙළපතින් පැමිණි සදාකාලික රජු ලෙස ක්‍රිස්තුස් වහන්සේව හඳුනා ගනී.

**අමතර පාඨ**

- ''නුබේ සිංහාසනය සදහටම පිහිටුවනු ලබන්නේය.'' - (2 සාමුවෙල් 7:16)
- ''දාවිත්ගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වංශාවලිය මෙසේ ය.'' - (මතෙව් 1:1)

❖ දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේ තුළ රාජකීයත්වය සම්පූර්ණ කරන ආකාරය මෙම පාඨ වලින් පෙන්වා දෙයි.

## නව ගිවිසුම - ක්‍රිස්තුස් වහන්සේ හා ශුද්ධාත්මයාණන් වහන්සේ

- **ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන් එවීමට පොරොන්දු වීම**. (ජොහාන් 14:16-17,26)

**ඉගෙනුම් පල**

- ගුරුවයෙකු සහ මාර්ගෝපදේශකයෙකු ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ පොරොන්දුව දැන ගනියි.

**අමතර පාඨ**

- ''එවිට මම පියාණන් වහන්සේගෙන් අයදින්නෙමි. උන්වහන්සේ ද ඔබ සමඟ සදහටම සිටින පිණිස වෙනත් සහනදායෙකුව දෙන සේක.'' - (ජොහාන් 14:16)
- ''ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින් මා වදාල සියල්ල ඔබට සිහිපත් කරවන සේක.'' - (ජොහාන් 14:26)

❖ ශුද්ධාත්මයාණන් වහන්සේ ජේසුස් වහන්සේගේ මෙහෙවර නොනවත්වා කරගෙන යාමට ශු. සභාවට මඟ පෙන්වන ආකාරය මෙමෙ පාඨ වලින් පෙන්වා දෙයි.



- **ශුද්ධාත්මයාණන් වහන්සේ මඟපෙන්වන්නෙක් හා සත්‍යතාවයේ ආත්මයාණන් ය** (ජොහාන් 14:15-31)

**ඉගෙනුම් ඵල :**

- ශුද්ධ වූ සභාවට මගපෙන්වීම හා සැනසීම ලබා දීමේ දී ආත්මයාණන්ගේ කාර්යභාරය තේරුම් ගනියි.

**අමතර පාඨ**

- ''සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ පැමිණි කළ උන්වහන්සේගේ සම්පූර්ණ සත්‍ය කරා යාමට ඔබට මඟ පෙන්වන සේක,'' - (ජොහාන් 16:13)
- ''ශාන්තිය ඔබ මත ප්‍රදානය කර යමි. මාගේ ශාන්තිය ඔබට දෙමි.'' - (ජොහාන් 14:27)

❖ ඇදහිලිවන්තයන්ගේ ජීවිත තුළ ආත්මයාණෝ ක්‍රියාකාරිව වැඩ වසන බව මෙම පාඨ මගින් පෙන්වයි.

**ශුද්ධ වූ සභාව තුළ මෙහෙවර** (පාවුළු තුමන්ගේ ලිපි) (1 කොරින්ති 12, එපීස 4, රෝම 12)

**ඉගෙනුම් ඵල**

- එකමුතුකම ගොඩනැගීමට සහ ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීමෙහි ලා ශු. සභාවේ මෙහෙවර ඉගෙන ගනියි.

**අමතර පාඨ**

- "මනුෂ්‍ය ශරීරයෙහි බොහෝ අවයව තිබුණත් ඒ අවයව විවිධාකාර වුවත් ඒ සියල්ල එකම ශරීරයක් වන්නාක් මෙන් ක්‍රිස්තුස් වහන්සේත් එකම ශරීරයක් වන සේක." - (1 කොරින්ති 12:12)
- "දෙවියන් වහන්සේ සියලු දීමනා ද, කැඳවීම ද, වෙනස් නොකරන සේක." - (රෝම 11:29)

❖ මෙම පාඨ මඟින් සභාව ක්‍රිස්තුස් වහන්සේගේ ගිවිසුම් මෙහෙවර දිගටම කරගෙන යන බවත් සෑම සාමාජිකයෙකුටම ඊට අදාළ කාර්‍යභාරයක් ඇති බවත් පෙන්වා දෙයි.

**පර්වතය වන පේදුරු හා අපෝස්තලික මෙහෙවර** - (මතෙව් 16:18)

**ඉගෙනුම් ඵල**

- පේදුරුගේ භූමිකාව හා අපෝස්තලික අධිකාරිය තේරුම් ගනී.

**අමතර පාඨ**

- "ඔබ පේදුරුය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නඟන්නෙමි." - (මතෙව් 16:18)
- "මාගේ බැටළුවන් පෝෂණය කරන්න." - (ජොහාන් 21:17)

❖ අපෝස්තලික අධිකාරිය සහ ගිවිසුම් අඛණ්ඩතාව ස්ථාපිත කිරීම පිළිබඳව මෙම පාඨ පෙන්වා දෙයි.



## II. සක්‍රමේන්තු - අභිවෘද්ධි ආලේපය

**අවධානය යොමු කිරීම:** ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම (නික්මයාම 30:22-33); ශුද්ධාත්ම දීමනාවෙන් මුද්‍ර තැබීම (2 කොරින්ති 1:21-22, එපීස 1:13); ක්‍රිස්තුස් වහන්සේගේ සොල්දාදුවන් (2 තිමොති 2:3)

**ඉගෙනුම් ඵල**

- අභිවෘද්ධි ආලේපය මඟින් ශුද්ධාත්මයාණන්ගෙන් ශක්තිමත් කර ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ කරන බව තේරුම් ගනියි.
- දූත සේවාව (මෙහෙවර) හා සාක්ෂි දැරීම සඳහා ගිවිසුම් ලකුණක් ලෙස මෙම ප්‍රසාද නිධානය හඳුනා ගනී.

**අමතර පාඨ**

- "උන්වහන්සේගේ මුද්‍රාව අප පිට තබා අපගේ සිත් තුළ අපට අත්තිකාරමක් වශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවා වදාළ සේක" - (2 කොරින්ති 1:22)
- "ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ විශ්වාසී භේවායෙකු සේ දුක්විඳීමට පංගුකාරයෙක් වන්න" - (2 තිමති 2:3)

❖ අභිවෘද්ධි ආලේපය මඟින් ගිවිසුමට සම්බන්ධ වීම ශක්තිමත් කර ක්‍රිස්තු මෙහෙවර සඳහා සූදානම් කරයි.

## III. විශ්වාස ලක්ෂණය - නිසියානු විශ්වාස ලක්ෂණය

**අවධාරණය** - විශේෂ අවධානයක් 08 හා 09 වගන්ති වලට දෙමින් නිසියානු විශ්වාස ලක්ෂණයේ සියලු වගන්ති අධ්‍යනය කරයි.

**ඉගෙනුම් ඵල**

- විශ්වාස ලක්ෂණය උච්චාරණය කර පැහැදිලි කරයි.
- ශුද්ධාත්මයාණන්ගේ භූමිකාව හා ශුද්ධ වූ සභාව පිළිබඳ තේරුම් ගනියි.
- විශ්වාස ලක්ෂණය, සක්‍රමේන්තු හා සභා මෙහෙවර එකට සම්බන්ධ කර තේරුම සොයා ගනියි.

**අමතර පාඨ :**

- "එසේ වී නමුත් ඒ තැනැන්වහන්සේ එනම් සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ පැමිණි කළ උන්වහන්සේ සම්පූර්ණ සත්‍යතාවය කරා යෑමට ඔබට මඟ පෙන්වන සේක." - (ජොහාන් 16:13)
- "මම ඔබට කියමි. ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි." - (මතෙව් 16:18)

❖ ඇදහිල්ලේ සමඟිය හා ගිවිසුම් සභාව තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ භූමිකාව පෙන්වා දෙයි.

## IV. යාච්ඤාව - ගීතාවලිය හා ප්‍රශංසා ගී

**පාඨ** : නික්මයාම 15, ගීතාවලිය 103, යෙසායා 12



### ඉගෙනුම් ඵල

- විශ්වාසය, ස්තුතිය හා දෙවියන් වහන්සේගේ ගිවිසුම පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.
- දෙවියන් වහන්සේගේ විශ්වාසනීයත්වය, කරුණාව හා මඟපෙන්වීම හඳුනා ගනී.

### අමතර පාඨ

- ''සමිඳාණෝ මා සවිය හා ගීතය වෙති.'' - (නික්මයාම 15:2)
- ''සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණය. නොකිපෙන සුලුය. අතිශයින් කරුණාවන්ත ය.'' - (ගීතාවලිය 103:8)
- ''සමිඳුන් කළ අරුම පුදුම දේ නිසා පසස් ගී ගයන්න. මුළු ලොවට ම ඒ ගැන දන්වන්න'' - (යෙසායා 12:5)

❖ ප්‍රශංසාව හා කෘතඥතාවය දෙවියන් වහන්සේගේ ගිවිසුම් විශ්වාසනීයභාවය පිළිබඳව මෙම පාඨ අපට උගන්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනා

- **කථාන්දර ක්‍රමය** : පරණ ගිවිසුමේ සඳහන් ගිවිසුම්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණත්වය, ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශුද්ධ වූ සභාවේ සේවාව
- **දෘශ්‍යාධාර** : ආදම්ගේ හා ආබ්‍රහම්ගේ ගිවිසුම්, සක්‍රමේන්තු සඳහා ජලය හා තෛලය, ශුද්ධාත්මයාණන් සඳහා ගින්දර, පේදුරුතුමාගේ යතුරු, අපෝස්තුලුවරුන්ගේ අධිකාරිත්වය
- **නිර්මාණාත්මක ක්‍රියාකාරකම්** : ගිවිසුම් අනුපිළිවෙල හා අභිවෘද්ධි ආලේපයේ සංකේත ඇඳීම,
- **භූමිකා රංගනය** : පෙන්තකොස්ත දිනය, අභිවෘද්ධි ආලේපය, අපෝස්තලික මෙහෙවර, ගිවිසුම් සම්බන්ධතාවය පිළිබඳ නිර්මාණාත්මක ලේඛනයක් ලිවීම
- **ක්‍රියාකාරී ගීත** : ගීතාවලිය ප්‍රශංසා ගීත, පාස්කු ගිතිකා, උදාන ගීත



## V. තක්සේරුව හා ඇගයීම

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත වටය | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු | 40 |
| කටපාඩම් පද වටය | ගීතාවලිය හා අමතර පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර වටය | ගිවිසුම් අනුපිළිවෙල හෝ සක්‍රමේන්තු අවස්ථා | 20 |
| අවබෝධය (වාචික ප්‍රශ්න ඇසීම) | "ඇයි" ප්‍රශ්න හෝ ගිවිසුම් තේමා | 20 |

### සම්මාන මට්ටම

- රන් — 85–100
- රිදී — 70–84
- ලෝකඩ — 50–69
- සහතික පත්‍ර — 50 අඩු

## අමතර පාඨ ඇතුලත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ

- ක්‍රිස්තුස් වහන්සේ ගිවිසුමේ සම්පූර්ණත්වය බව ගැඹුරින් පිළිගනී.
- උච්චාරණය හා මෙනෙහි කිරීම සඳහා කටපාඩම් පද සපයයි.
- ශුද්ධ ලියවිල්ල, සක්‍රමේන්තු, විශ්වාස ලක්ෂණය හා යාච්ඤාව යන තේමාවන් මෙයට සම්බන්ධ කරමින් අර්ථය සොයා ගනියි.

